# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 2,371 - 2024 පෙබරවාරි මස 09 වැනි සිකුරාදා - 2024.02.09**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## IV(ආ) වැනි කොටස - පළාත් පාලනය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිටුව |
|---|---|
| තනතුරු-ඇබෑර්තු .... ... ... | — |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... | — |
| බඩුබාහිරාදිය විකිණීම් ... ... ... | — |
| පළාත් පාලන නිවේදන ... ... ... | 162 |
| අතුරු ව්‍යවස්ථා ... ... ... | — |
| පළාත් පාලන සහ ඡන්ද ආඥාපනත යටතේ දැන්වීම් .. | — |
| ආදායම් හා වියදම් පිළිබඳ ප්‍රකාශන ... ... | — |
| අයවැය ලේඛන ... ... ... | — |
| දේපළ විකිණීම් ... ... ... | — |
| විවිධ දැන්වීම් ... ... ... | 166 |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**
**වැදගත් නිවේදනයයි**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12 00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට්* පත්‍රය පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2024 මාර්තු 01 වැනි දින පළකරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2024 පෙබරවාරි මස 16 වැනි දින දහවල් 12 00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය."*

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2024 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

මෙම *ගැසට් පත්‍රය* *www.documents.gov.lk* වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

161 - B 82540 — 5,403 (2024/02)

# පළාත් පාලන නිවේදන

## මතුගම ප්‍රාදේශීය සභාව

### ගෝඝාතක ආඥාපනත අනුව විරෝධතා කැඳවීම

මතුගම ප්‍රාදේශීය සභාවේ වැලිපැන්න උපකාර්යාලයට අයත් පහත සඳහන් ස්ථානයේ ඉදිකර ඇති ගෝඝතකාගරය පවත්වාගෙන යාම සම්බන්ධයෙන් විරෝධතා ඇත්නම් 2024.02.22 දිනට පෙර මතුගම ප්‍රාදේශීය සභාවේ ප්‍රධාන කාර්යාලයට හෝ වැලිපැන්න උප කාර්යාලයට ඉදිරිපත් කරන ලෙස මෙයින් දනුම් දෙමි.

| | | |
|---|---|---|
| ඉල්ලුම්කරුගේ නම | : | මොහොමඩ් හම්දූන් මොහොමඩ් නිෆ්ලාස් |
| ලිපිනය | : | අංක 146/3, මරික්කාර් පාර, දර්ගානගරය. |
| ස්ථානය | : | අංක 11/C, මුස්ලිම් පාර, වැලිපැන්න |

නෙලු නිශාන්ති ඉද්දගොඩ,
ප්‍රාදේශීය සභාවේ ලේකම් හා මතුගම ප්‍රාදේශීය සභාවේ බලතල,
කාර්ය, කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ නිලධාරී.

මතුගම ප්‍රාදේශීය සභාව.
2024 ජනවාරි මස 22 වැනි දින.

02-96

---

## තවලම ප්‍රාදේශීය සභාව

### දියුණු කළ ප්‍රදේශයක් වශයෙන් ප්‍රකාශයට පත් කිරීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9(3) වගන්තිය සමග කියවිය යුතු එකී පනතේ 134(1) වන උපවගන්තියෙන් තවලම ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාරව, තවලම ප්‍රාදේශීය සභාවේ ලේකම් විසින් 2023.10.17 දින තීරණ අංක 2023/10/17/100 දරන තීරණය යටතේ තවලම උතුර -227 දරන ග්‍රාම නිලධාරී වසම දියුණු කළ ප්‍රදේශයක් ලෙස ප්‍රකාශයට පත් කිරීම සඳහා ගෙන ඇති පහත සඳහන් තීරණයට 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134 (1) උපවගන්තිය ප්‍රකාරව පළාත් පාලන සහකාර කොමසාරිස්/නියෝජ්‍ය පළාත් පාලන කොමසාරිස් ලෙස සංදීපනී නිල්මිණි දම්මුල්ලගේ වන මා විසින් අනුමැතිය දෙන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

සංදීපනි නිල්මිණි දම්මුල්ලගේ,
පළාත් පාලන සහකාර කොමසාරිස්/නියෝජ්‍ය
පළාත් පාලන කොමසාරිස්- ගාල්ල.

2024 ජනවාරි මස 26 වැනි දින,
ගාල්ල පළාත් පාලන සහකාර කොමසාරිස් කාර්යාලයේ දී ය.

#### තීරණය

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134 වන වගන්තියේ (1) වගන්තිය ප්‍රකාරව තවලම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත පිහිටි පහත උපලේඛනයේ විස්තර කෙරෙන තවලම උතුර - 227 දරන ග්‍රාම නිලධාරී කොට්ඨාසය දියුණු කළ ප්‍රදේශයක් වශයෙන් ප්‍රකාශයට පත් කිරීමටත්, ඒ සඳහා ගාල්ල දිස්ත්‍රික් පළාත් පාලන සහකාර කොමසාරිස්ගේ අනුමැතිය ලබා ගැනීමටත් ප්‍රාදේශීය සභා පනතේ 9(3) වගන්තිය ප්‍රකාරව මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව තීරණය කරමි.

#### *උපලේඛනය*

දකුණු පළාතේ ගාල්ල දිස්ත්‍රික්කයේ ඉහත කී තවලම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පිහිටි අංක 227 දරන තවලම උතුර ග්‍රාම නිලධාරී වසම,

*උතුරට* - හබරකඩ නැගෙනහිර ග්‍රාම නිලධාරි වසම් සීමාවෙන් ද,
*දකුණට* - හිනිදුම උතුර ග්‍රාම නිලධාරි වසම් සීමාවෙන් ද,
*නැගෙනහිරට* - තවලම මූකලාන හා තවලම දකුණ ග්‍රාම නිලධාරි වසම් සීමාවෙන් ද,
*බටහිරට* - බටහේන හා හබරකඩ ග්‍රාම නිලධාරි වසම් සීමාවෙන් ද, මායිම් ව ඇති ප්‍රදේශය.

02-97

---

**රජ්ගම ප්‍රාදේශීය සභාව**

දියුණු කළ ප්‍රදේශයක් වශයෙන් ප්‍රකාශයට පත් කිරීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9(3) වගන්තිය සමග කියවිය යුතු එකී පනතේ 134(1) වන උපවගන්තියෙන් ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාරව, රජ්ගම ප්‍රාදේශීය සභාවේ ලේකම් විසින් 2024 වර්ෂයේ ජනවාරි 16 වැනි දින තීරණ අංක 24/1/16/3200 යටතේ ගෙන ඇති පහත සඳහන් තීරණයට එකී පනතේ 134(1) උපවගන්තියෙන් පළාත් පාලන සහකාර කොමසාරිස් වෙත ලැබී ඇති බලතල ප්‍රකාරව ගාල්ල පරිපාලන දිස්ත්‍රික්කයේ පළාත් පාලන සහකාර කොමසාරිස්/නියෝජ්‍ය පළාත් පාලන කොමසාරිස් ලෙස කටයුතු කරනු ලබන සංදීපනී නිල්මිණි දම්මුල්ලගේ වන මා විසින් අනුමැතිය දෙන ලද බව මහජනයා වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

සංදීපනී නිල්මිණි දම්මුල්ලගේ,
පළාත් පාලන සහකාර කොමසාරිස් - ගාල්ල,

2024 ජනවාරි මස 16 වැනි දින,
ගාල්ල පළාත් පාලන සහකාර කොමසාරිස් කාර්යාලයේ දී ය.

**තීරණය**

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134(1) වගන්ති ප්‍රකාරව පහත උපලේඛනයේ විස්තර කර ඇති රජ්ගම ප්‍රාදේශීය සභාවේ සමස්ථ බල ප්‍රදේශයම දියුණු කළ ප්‍රදේශයක් වශයෙන් ප්‍රකාශයට පත් කිරීමටත්, ඒ සඳහා පළාත් පාලන සහකාර කොමසාරිස්ගේ /නියෝජ්‍ය පළාත් පාලන කොමසාරිස්ගේ අනුමැතිය ලබා ගැනීමට තීරණය කරමි.

**උපලේඛනය**

***රජ්ගම ප්‍රාදේශීය සභාවේ පරිපාලන සීමා (1 කොටස)***

*උතුරට* : උඩුගල්පිටිය ඩ්‍රීම් විලේජ් හෝටලයේ දකුණු පස තාප්පය මායිම් කරගෙන මුහුදට යාවෙන ලක්ෂයේ සිට ඩ්‍රීම් විලේජ් හෝටලයේ දකුණු පස තාප්පය දිගේ ගාල්ල කොළඹ මහා මාර්ගය හරහා ගුඩ් ෂෙඩ් මාවත දිගේ ගොස් රත්ගම් කලපුව දක්වාද, එතැන් සිට රත්ගම කලපුව බටහිර ඉවුර දිගේ අක්කර විස්ස පන්සල පිටුපස කුඹුර දක්වා ඇඳෙන රේඛාවකින් ද,

*නැගෙනහිරට* : එම ලක්ෂයේ සිට අක්කර විස්ස පන්සල පිටුපස කුඹුර දිගේ සිරිකඳුර වත්ත ගේට්ටුව දක්වා ද, එතැන් සිට පිංකන්ද, ගිනිමැල්ලගහ මාර්ගයේ අඹගහ හන්දිය දක්වා ද, එම ලක්ෂයේ සිට යකඩවල ඇළ දක්වා ද, එතැන් සිට හොරගම්පිට ඇලේ බස්නාහිර මායිමේ වඩුගොඩ දක්වා ද, ඉන්පසුව හොරගම්පිට ඇලේ ඉතිරි කොටස දිගේ ගිං ගඟ හමුවන ස්ථානය දක්වා ඇඳෙන රේඛාවකින් ද,

*දකුණට* : හොරගම්පිට ඇල ගිං ගඟට වැටෙන ලක්ෂයේ සිට ගිං ගඟ මුහුදට වැටෙන ලක්ෂය දක්වා ඇඳෙන රේඛාවකින් ද,

*බස්නාහිරට* : ගිං ගඟ මුහුදට වැටෙන ලක්ෂයේ සිට දොඩන්දූව, උඩුගල්පිටිය ඩ්‍රීම් විලේජ් හෝටලයේ දකුණු පසින් ඇති තාප්පය මායිම් කරගෙන මුහුදට යාවෙන ලක්ෂය දක්වා ඇඳෙන රේඛාවකින් ද වටවන භූමි ප්‍රමාණය සහ රජ්ගම ප්‍රාදේශීය සභාවේ පරිපාලන සීමා (II කොටස)

*උතුරට* : මාදම්පා ගඟ මුහුදට වැටෙන ලක්ෂයේ සිට එම ගඟ මැදින් දෙල්දූව දක්වා ගොස් දෙල්දූව බස්නාහිර මායිමේ දෙල්දූව දූපත රජ්ගම ප්‍රාදේශීය සභාවට ඇතුළත් වන පරිදි ගඟේ නැගෙනහිර පැත්ත දක්වා ද, එතැන් සිට ගල්බොක්ක ගමේ නැගෙනහිර මායිම දක්වා ඇඳෙන රේඛාවකින් ද,

*නැගෙනහිරට* : ගල්බොක්ක සිට ලේනදූව දක්වා පැමිණ එතැන් සිට ගලගොඩ නැගෙනහිර මායිම දක්වා ද, එම ලක්ෂයේ සිට මාදම්පේ, උස්මුදුලාව, මීටියාගොඩ මාර්ගයේ රන්ගල්දූව දක්වා ද, එතැන් සිට ප්‍රධාන මාර්ගය දිගේ ගල්දූවට හැරෙන මාර්ගය දක්වාද, එම ලක්ෂයේ සිට කහව බටපොල මාර්ගයේ වේරගොඩ විජයබා මහ විද්‍යාලේ නැගෙනහිර මායිම දක්වා ද, එතැන් සිට හරන්නාගල වත්ත. නුන්ගල, තෙල්වත්ත ගඟ දක්වා පැමිණ ඉන්පසු තෙල්වත්ත ගඟ රන්ගලු ඇල දිගේ රන්ගලු පාලම දක්වා ද, එතැන් සිට හික්කඩුව ගඟ දක්වා ද ඇඳෙන රේඛාවකින් ද,

*දකුණට* : එතැන් සිට හික්කඩුව ගඟ මුහුදට වැටෙන ලක්ෂය දක්වා ඇඳෙන රේඛාවකින් ද,

*බස්නාහිරට* : හික්කඩුව ගඟ මුහුදට වැටෙන ලක්ෂයේ සිට මාදම්පා ගඟ මුහුදට වැටෙන ලක්ෂය දක්වා වූ මුහුදු වෙරළ මායිම දිගේ ඇඳෙන රේඛාවකින් ද වට වූ භූමි ප්‍රදේශය ඇතුළත් වේ.

02-98

---

**උතුරු මැද පළාත් ආණ්ඩුකාරවර කාර්යාලය**

වරිපනම් ප්‍රතිශතය සඳහා අමාත්‍යවරයාගේ අනුමැතිය ලබා ගැනීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9(3) වගන්තිය සමග කියවිය යුතු එකී පනතේ 134(1) වන උපවගන්තියෙන් ලේකම් වෙත පැවරී ඇති බලතල ප්‍රකාර රාජාංගනය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ දියුණු කළ ප්‍රදේශය ඇතුළත පිහිටියා වූ දේපළ මත වාර්ෂික වටිනාකමින් සියයට තුනක (3%) වාර්ෂික වරිපනම් බද්දක් පනවා අය කිරීම සඳහා රාජාංගනය ප්‍රාදේශීය සභාවේ බලතල ක්‍රියාත්මක කරන කාර්ය, කර්තව්‍ය ඉටු කරන රාජාංගනය ප්‍රාදේශීය සභාවේ ලේකම්, ඩබ්. එම්. සිසිල් විජේසිංහ ගෙන ඇති තීරණය අනුමත කරනු ලබන්නේ ය.

මහීපාල හේරත්,
ආණ්ඩුකාරවර,
පළාත් පාලන විෂයභාර අමාත්‍ය,
උතුරුමැද පළාත.

2023 අගෝස්තු මස 16 වැනි දින,
උතුරුමැද පළාත් ආණ්ඩුකාරවර කාර්යාලයේ දී ය.

02-418

---

**ලංකාපුර ප්‍රාදේශීය සභාව**

වරිපනම් බදු අය කිරීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134 වැනි වගන්තියේ (i) වැනි උපවගන්තියෙන් ප්‍රාදේශීය සභාවට ලැබී ඇති බලතල ප්‍රකාර ලංකාපුර ප්‍රාදේශීය සභාව විසින් 2023.05.12 දින තීරණ අංක LPS/2023/05/12/87 යටතේ වරිපනම් කාර්යය සම්බන්ධයෙන් මෙහි පහත සඳහන් යෝජනාව සම්මත කර ඇති බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

ජී. ජී. ඩී. එම්. අයි දිසානායක,
බලතල කාර්ය කර්තව්‍ය ක්‍රියාත්මක කරන නිලධාරි,
ලංකාපුර ප්‍රාදේශීය සභාව,
තල්පොත,
පොළොන්නරුව.

2024 ජනවාරි මස 30 වැනි දින,
ලංකාපුර ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

**යෝජනාව**

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134 වැනි වගන්තියේ (i) වැනි උපවගන්තියෙන් ලැබී ඇති බලතල ප්‍රකාර පොළොන්නරුව දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය පළාත් පාලන සහකාර කොමසාරිස්ගේ අනුමැතිය ඇතිව ලංකාපුර ප්‍රාදේශීය සභාව විසින් දියුණු කළ ප්‍රදේශ බවට ප්‍රකාශයට පත් කර ඇති ප්‍රදේශවල පිහිටා ඇති නිශ්චල දේපළවල හා ඒ ඒ පන්තියට හෝ වර්ගයට අයත් නිශ්චල දේපළවල 2023 වර්ෂය තුළ බල පැවැත් වූ වාර්ෂික වටිනාකම 2024 වර්ෂය සඳහා එකී පනතේ 146 වැනි වගන්තියේ නියමය පරිදි සම්මත කිරීමටත්,

ඉහත කී 134 වගන්තියේ (i) වැනි උපවගන්තියෙන් ලැබී ඇති බලතල යටතේ එකී නිශ්චල දේපළ අතරින් කුඹුරු ඉඩම් හැර සෙසු සියලුම නිවාසවල, ගොඩනැගිලිවල, ඉඩම් හා ගෙපත්වල වාර්ෂික වටිනාකමින් සියයට හතරක (4%) වරිපනම් බද්දක් 2025 වර්ෂය සඳහා නියම කිරීමටත් සහ,

එකී වරිපනම්, එකී වර්ෂයේ මාර්තු 31, ජුනි 30, සැප්තැම්බර් 30, දෙසැම්බර් 31 යන දිනවලින් අවසන් වන කාර්තු හතර තුළ දී සමාන වාරික හතරකින් ගෙවන ලෙසට, එකී 134 වැනි වගන්තියේ 6 වැනි උපවගන්තිය යටතේ විධානය කිරීමටත් ,

ඉහත කී වර්ෂයට අදාළ සම්පූර්ණ වරිපනම් මුදල 2024 ජනවාරි මස 31 වැනි දින හෝ එදිනට පෙර ප්‍රාදේශීය සභා කාර්යාලයට ගෙවනු ලැබුවහොත් ඒ මුදලෙන් සියයට දහය (10%)ක වට්ටමක් ද, කිසියම් කාර්තුවකට අදාළ වරිපනම් මුදල ඒ කාර්තුවේ පළමුවන මාසය අවසන් වීමට පෙර ප්‍රාදේශීය සභාවට ගෙවනු ලැබුවහොත් ඒ කාර්තුවේ මුදලෙන් සියයට පහක (5%) වට්ටමක් ද ගෙවනු ලබන බවත්, ඒ ආකාරයේ යම් වට්ටමක් ලබා ගැනීමට හැකි වන්නේ අදාළ කාලයට පෙර පැවැති හිඟ වරිපනම් වේ නම්, හිඟය ද ගෙවා අවසන් කළහොත් පමණක් බවත් ලංකාපුර ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නීය.

ජී. ජී. ඩී. එම්. අයි. දිසානායක,
බලතල කාර්යය කර්තව්‍ය ක්‍රියාත්මක කරන නිලධාරි,
ලංකාපුර ප්‍රාදේශීය සභාව,

තල්පොත,
පොළොන්නරුව.

02-409

---

**උඩපළාත ප්‍රාදේශීය සභාව**

උඩපළාත ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ගවමස් අලෙවි සලක් පවත්වාගෙන යාමට අදාළ ගැසට් නිවේදනය

මෙහි පහත උපලේඛනයේ නම සඳහන් තැනැත්තා විසින් ඔහුගේ නම ඉදිරියෙන් දක්වෙන ගවමස් වෙළඳපලක් පවත්වාගෙන යාමට ගෝ ඝාතක ආඥාපනතේ 07(1) වැනි වගන්තිය යටතේ බලපත්‍රයක් නිකුත් කරන ලෙස උඩපළාත ප්‍රාදේශීය සභාවේ නිසි බලධාරියා වන මා වෙතින් ඉල්ලීමක් ඉදිරිපත් කරනු ලැබේ.

පහත උපලේඛනයේ සඳහන් ස්ථානයේ ගවමස් වෙළඳසැලක් පවත්වාගෙන යාම වෙනුවෙන් බලපත්‍රයක් නිකුත් කිරීමට විරුද්ධතාවයක් දක්වන්නන් වෙතොත් එසේ විරුද්ධත්වය දැක්වීමට හේතු සඳහන් කරමින් මෙම නිවේදනය *ගැසට් පත්‍රයේ* පළ වූ දිනයේ සිට සති 04 ක් ගෙවීමට මත්තෙන් පිටපත් දෙකකින් යුක්තව ලියාපදිංචි තැපෑලෙන් හෝ අතින් ගෙනවිත් භාර දෙන ලෙස උඩපළාත ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ පදිංචිකරුවන් වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

එස්. එම්. කේ. ජී. එස්. සුහසිංහ,
ලේකම්,
උඩපළාත ප්‍රාදේශීය සභාව.

2024 පෙබරවාරි මස 01 වැනි දින,
උඩපළාත ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

**උපලේඛනය**

| *අනු. අංකය* | *ඉල්ලුම්කරුගේ නම* | *ගවමස් වෙළඳසැල පවත්වාගෙන යාමට අපේක්ෂිත ස්ථානය* |
|---|---|---|
| 01 | එම්. ජේ. එම්. හාරිස් | අංක 494/1ඒ, කළුගමුව, ගෙලිඔය |

02-365

**ඉබ්බාගමුව ප්‍රාදේශීය සභාව**

2024 වර්ෂය සඳහා නව එළ ගව මස් වෙළඳසැලක් පවත්වාගෙන යාමට බලපත්‍රයක් නිකුත් කිරීම

මෙහි පහත උපලේඛනයේ සඳහන් අය විසින් උපලේඛනයේ සඳහන් ස්ථානයේ නව එළ ගව මස් විකිණීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම සඳහා ඉල්ලීමක් මා වෙත ඉදිරිපත් කර ඇති බවත්, එම බලපත්‍රය ලබා දීම පිණිස ඉබ්බාගමුව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පදිංචි තැනැත්තන් විරුද්ධ වන්නේ නම් එසේ විරුද්ධ වීමට තිබෙන කරුණු පිළිබඳ ලිඛිත ප්‍රකාශනයක් පිටපත් දෙකකින් යුක්තව මෙම දැන්වීම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* IV(ආ) කොටසේ පළ වූ දින සිට දින 07ක් ඇතුළත මා වෙත ඉදිරිපත් කළ යුතු බව ගෝ ඝාතක ආඥාපනතේ අංක 7(2) වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙනු ලැබේ.

එච්. එම්. නිරෝෂා හේරත්,
ලේකම්,
ඉබ්බාගමුව ප්‍රාදේශීය සභාව.

2024 ජනවාරි මස 24 වැනි දින,
ඉබ්බාගමුව ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

**උපලේඛනය**

| *අනු. අංකය* | *එළ ගව මස් වෙළඳ සැල පවත්වාගෙන යාමට ඉල්ලුම් කළ තැනැත්තාගේ නම හා ලිපිනය* | *එළ ගවමස් වෙළඳ සැල පවත්වාගෙන යාමට අදහස් කරන ස්ථානයේ ලිපිනය හා හඳුනා ගැනීමේ විස්තර* | *ග්‍රාම නිලධාරි වසම හා අංකය* |
|---|---|---|---|
| 01 | එම්. වයි. එම්. ෆාරුක් මයා,<br>මඩිගේ, මුදුන්දූව.<br>ජා. හැ. අංකය (IBG/520712/8347) | මඩිගේ මුදුන්දූව ලිපිනයේ ඇති අයිදාස් සපරුල්ලා මහතාට අයත් කඩ කාමරය | 526 - දේතිලි අංග |

02-94

# විවිධ දැන්වීම්

**ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාව**

2024 වර්ෂය සඳහා සභාව සතු ක්‍රීඩා භූමිය, ආදාහනාගාරය, සභා ශ්‍රවණාගාරය බදු දීමේ දී හා සුසාන භූමිවල එලක සෑදීම සඳහා ගාස්තු අය කිරීම

ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාව සතු ක්‍රීඩා භූමි, සභා ශ්‍රවණාගාරය හා සුසාන භූමිවල එලක සෑදීම සඳහා 2024 වර්ෂයට අය කරන ගාස්තුවල වෙනසක් සිදු නොවන අතර, ආදාහනාගාරය සඳහා ගාස්තු අය කිරීම 2024 පෙබරවාරි මස 01 දින සිට සංශෝධනය කර අය කිරීමට මම තීරණය කරමි.

ටී. ආර්. සී. කේ. ගුණසේකර,
ලේකම් හා බලතල කාර්ය කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ නිලධාරි,
ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාව.

2024 ජනවාරි මස 20 වැනි දින,
ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාවේ දී ය.

**ආදාහනාගාරය සඳහා ගාස්තු අය කිරීම**

01. බල ප්‍රදේශය තුළ පදිංචි අයෙකුගේ මෘත දේහයක් ආදාහනය කිරීම සඳහා ගාස්තු - රු. 14,000.00
02. බල ප්‍රදේශය පිටත පදිංචි අයෙකුගේ මෘත දේහයක් ආදාහනය කිරීම සඳහා ගාස්තු - රු. 15,000.00

02-406

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.